# ග්‍රාමීය සංවර්ධනය කෙරෙහි සංචාරක කර්මාන්තයෙන් සිදුවන බලපෑම අධ්‍යයනය කිරීම: ලංකාගම පාරිසරික සංචාරක කලාපය ඇසුරින්

ආර්.පී.අයි. තුෂාරි*

ලෝකය අද විශ්ව ගම්මානයක් බවට පත්ව ඇති බැවින් සංචාරක කර්මාන්තය ග්‍රාමීය, නාගරික ක්ෂේත්‍රයන් පුරා පුළුල්ව පැතිර පවතී. එබැවින් සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින සෑම රටකම ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකමක් බවට සංචාරක කර්මාන්තය පත්ව ඇත. සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට පදනම සකස් වන්නේ 1966 වර්ෂයේ ලංකා සංචාරක මණ්ඩලය පිහිටුවීමත් සමඟිනි. මෙලෙසින් ආරම්භ වූ සංචාරක කර්මාන්තය විදේශ විනිමය උත්පාදනය කිරීමටත්, රැකියා අවස්ථා නිර්මාණය කිරීමට හා ප්‍රාදේශීය සංවර්ධනය ආදී ක්ෂේත්‍රයන්හි වර්ධනයට බෙහෙවින් ඉවහල් විය. විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනයට දැඩි ලෙස බලපෑම් කරනු ලැබුවේ සංචාරක කර්මාන්තය ග්‍රාමීය ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් වර්ධනය වීමයි. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ ග්‍රාමීය සංවර්ධනය කෙරෙහි සංචාරක කර්මාන්තයෙන් සිදුවන බලපෑම ලංකාගම පාරිසරික සංචාරක කලාපය ඇසුරින් අධ්‍යයනය කිරීමයි. උප අරමුණු ලෙස අධ්‍යයන ප්‍රදේශය තුළ සංචාරක කර්මාන්තයේ වර්තමාන ස්වභාවය පරීක්ෂා කිරීම හා අධ්‍යයන ප්‍රදේශයේ ග්‍රාමීය සංවර්ධනයට සංචාරක කර්මාන්තය මඟින් සිදුකර ඇති දායකත්වය පරීක්‍ෂා කිරීමයි. පර්යේෂණයේ දත්ත රැස්කිරීමේ ක්‍රමවේදයන් ලෙස ව්‍යුහගත ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා භාවිත කරනු ලැබීය. නියදිය ලෙස දේශීය විදේශීය සංචාරකයින් 20, විවිධ සේවා සපයන්නන් 40 සහ මාර්ගෝපදේශකයන් 5 ක් යොදා ගනු ලැබී ය. මෙම පර්යේෂණයේ අධ්‍යයනය මඟින් ලබාදිය හැකි නිගමනය වන්නේ ග්‍රාමීය සංවර්ධන උපක්‍රමයක් ලෙස සංචාරක ව්‍යාපාරය ඵලදායි ලෙස ලංකාගම ප්‍රදේශයට යොදාගත හැකිබවයි. ලංකාගම ප්‍රදේශයේ සංවර්ධනය ඉතාමත් අවම මට්ටමක පවතින අතර මෙම ප්‍රදේශයේ පවතින විවිධ සම්පත් අතරින් සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා පවතින පාරිසරික හා භෞතික පසුබිම තුළ එක් සංවර්ධනීය උපක්‍රමයක් ලෙස සංචාරක ව්‍යාපාරය යොදාගත හැකිබව අධ්‍යයනය තුළින් තහවුරු විය. එහිදී, මූලික වශයෙන් ග්‍රාමීය සංවර්ධනය තුළ ප්‍රදේශයේ ජනතාවගේ ආදායම් වර්ධනය කර ගැනීම, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා යොදා ගැනීමට හැකියාව පවතී. එනම්, සංචාරකයන් පැමිණීම නිසා එම ප්‍රදේශ තුළ හෝටල්, ගෙස්ට්හවුස්, කඩසාප්පු, මෙන්ම වක්‍ර හා සෘජු රැකියා අවස්ථාවන් නිර්මාණය වීම දක්නට ලැබේ. මේ අනුව ලංකාගම ප්‍රදේශයේ සංවර්ධනය සඳහා සංචාරක ව්‍යාපාරය යොදාගත හැකි බව තහවුරු වේ.

ප්‍රමුඛ පද: සංචාරක කර්මාන්තය, සංවර්ධනය, ග්‍රාමීය සංවර්ධනය, ආදායම් වර්ධනය, ලංකාගම ප්‍රදේශය, ග්‍රාමීය ප්‍රජාව

* භූගෝලවිද්‍යා අධ්‍යනාංශය rathnayaka091@gmail.com